1. ප්‍රධාන කරුණු ලේඛනය :- කල්බදු සේවා

**විස්තරය සහ අරමුණ**

විස්තරය

කල්බදු : ගණුදෙනුකරුවන් සඳහා වන කැපවීමේ මූලධර්මය ප්‍රමුඛ කරගත් වෘත්තිකයින්ට, ව්‍යාපාරිකයින්ට හෝ ආයතනයකට ලබාදෙන කල්බදු සේවා විසඳුමකි.

විචල්‍ය පොලී අනුපාත කල්බදු සේවාව

පීපල්ස් ලීසිං වෙතින් කල්බදු ක්‍රමයට මෝටර් රථයක් මිලදී ගැනීමට අදහස් කරන ගණුදෙනුකරුවන්ට විචල්‍ය පොලී අනුපාත කල්බදු සේවා හරහා විවිධ විශේෂාංග රැසක් ලබාදෙයි. මෙහිදී වසර හතක් දක්වා ආපසු ගෙවීමේ කාලයක් හා දැරිය හැකි මාසික වාරිකයක් ලබා දෙයි.

අරමුණ

මෝටර් රථ මිලදී ගැනීම සඳහා ගණුදෙනුකරුවන්ට මෙම සේවාව භාවිතා කල හැක. විශේෂයෙන්ම මෙහිදී වාණිජ වාහන සඳහා කල්බදු පහසුකම් ලබාදීම කෙරෙහි අවධානය යොමු කරයි.

ගණුදෙනුකරුවන්ට හිමිවන ප්‍රතිලාභ

කාර්, බස්, ලොරි, ජීප්, ට්‍රැක්ටර්, ත්‍රීවිලර්, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීමේදී විචල්‍ය පොලී අනුපාත කල්බදු සේවා මගින් පහත සඳහන් ප්‍රතිලාභ ලැබේ.

1. වසර 7 ක ආපසු ගෙවීමේ කාලයක් සමඟ දැරිය හැකි වාරිකයක්
2. ස්ථාවර හා විචල්‍ය පොලී අනුපාත යටතේ පහසුකම් ලබාගැනීමේ හැකියාව
3. ප්‍රාග්ධනයෙන් කොටසක් අඩුවන පරිදි ප්‍රාග්ධනයට එරෙහිව ගෙවීම් සිදුකිරීමේ හැකියාව.
4. ආපසු ගෙවීමේ කාලය තුල වත්කම ප්‍රතිස්ථාපනය කිරීමේ හැකියාව.

ඉලක්ක වෙළඳපොළ

මෙම සේවාව පිරිනැමීම සඳහා ආපසු ගෙවීමේ හැකියාවක් ඇති පුද්ගලයින් සහ ව්‍යවසායකයින් ඉලක්ක කරගෙන ඇත.

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

ණයදෙනුකරුවන්ට පහත තොරතුරු අතැතිව මෙම සේවාවට අයදුම් කල හැකිය.

1. හඳුනාගැනීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය / ගමන් බලපත්‍රය)
2. ලිපිනය සනාථ කිරීම (ජාතික හැඳුනුම්පත / උපයෝගීතා බිල්පත් / ග්‍රාම නිලධාරී සහතිකය )
3. ආදායම් සනාථ කිරීම (වැටුප් පත්‍රිකා / බැංකු ලේඛන / ආදායම් සනාථ කිරීම්)
4. ඇපකරු විස්තර - (හැඳුනුම්පත / උපයෝගීතා බිල්පත් / ආදායම් සනාථ කිරීම්)
5. වාහන විස්තරය - සැපයුම්කරුගේ විස්තරය / වාහන විස්තර

ආයතනික ණයදෙනුකරුවන් සඳහා

1. හඳුනාගැනීමේ සාක්ෂි (ව්‍යාපාර සංස්ථාපන සහතිකය ආකෘති අංක 41 හෝ 1)
2. ලිපින සනාථ කිරීම - (ආකෘති අංක 13)
3. ආදායම් සනාථ කිරීම්- (මූල්‍ය ප්‍රකාශන / බැංකු ලේඛන / වෙනත් ආදායම් සනාථ කිරීම්)
4. ඇපකරු විස්තර - (හැඳුනුම්පත / බිල් කිරීමේ සාක්ෂි / ආදායම් සනාථ කිරීම්)
5. වාහන විස්තරය - සැපයුම්කරුගේ විස්තර / වාහන විස්තර

නීතිමය ප්‍රතිපාදන

2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනත

පොලී අනුපාත

ණය පහසුකම සඳහා අදාල වන ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ, ණය පහසුකමේ වර්ගය, කාලසීමාව, ණයදෙනුකරුගේ ණය සුදුසුකම් සහ ඇප සුරැකුම්වල ස්වභාවය අනුව, වෙළඳපොල තත්වයන් මත පදනම්ව පොලී අනුපාතය වරින් වර සංශෝධනය කෙරේ.

අයකිරීම්

මූල්‍ය කල්බදු පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාල වේ.

1. ණය තොරතුරු කාර්යාංශ ගාස්තු
2. වාහන පරීක්ෂණ ගාස්තු

3. තැපැල් ගාස්තු
4. මුද්දර ගාස්තු
5. වාහන ලියාපදිංචි ගාස්තු
6. රක්‍ෂණ වාරික

දණ්ඩන ගාස්තු අදාල වන්නේ දින 5 ක සහන කාලයකින් පසුවය. වාර්ෂික දණ්ඩන පොලී අනුපාතය 48% කි.

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

**2.** ප්‍රධාන කරුණු ලේඛනය :- වාහන ණය සේවාව

**විස්තරය සහ අරමුණ**

විස්තරය

පීපල්ස් ලීසිං වෙතින් වත්කම උකසට තැබීම මගින් සහ වාහන ද්විත්ව අරමුණු සහිත වාහන ඇතුලුව ගෘහස්ථ භාවිතයට මෝටර් රථ, ජීප් මිලදී ගැනීමට අදහස් කරන ගණුදෙනුකරුවන්ට විචල්‍ය පොලී අනුපාතයට වාහන ණය ලබාදෙයි. මෙය වසර හතක් දක්වා දීර්ඝ ආපසු ගෙවීමේ කාලයක් සහ දැරිය හැකි මාසික වාරිකයක් සහිත සේවාවකි.

අරමුණ :

මෝටර් රථ මිලදී ගැනීම සඳහා ගණුදෙනුකරුවන්ට මෙම සේවාව භාවිතා කල හැක. විශේෂයෙන්ම මෙහිදී ගෘහස්ථ භාවිතයට සඳහා වාහන ණය පහසුකම් ලබාදීම කෙරෙහි අවධානය යොමු කරයි.

ගණුදෙනුකරුවන්ට හිමිවන ප්‍රතිලාභ

විචල්‍ය පොලී අනුපාතය යටතේ වාහන ණය මගින් පහත ප්‍රතිලාභ ගණුදෙනුකරුවන්ට ලැබෙනු ඇත.

1. වසර 7 ක ආපසු ගෙවීමේ කාලයක් සමඟ දැරිය හැකි වාරිකයක්
2. ස්ථාවර හා විචල්‍ය පොලී අනුපාත යටතේ පහසුකම් ලබාගැනීමේ හැකියාව
3. ආපසු ගෙවීමේ කාලය තුල වත්කම ප්‍රතිස්ථාපනය කිරීමේ හැකියාව.
4. අඩු ලේඛන ගාස්තු

ඉලක්ක වෙළඳපල

පෞද්ගලික භාවිතයට වාහන මිලදී ගන්නා වෘත්තිකයින් සහ ආයතනික ගණුදෙනුකරුවන් ඉලක්ක කර මෙම සේවාව සකසා ඇත.

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

ගණුදෙනුකරුවන්ට පහත විස්තර අතැතිව මෙම සේවාවට අයදුම් කල හැකිය.

1. හඳුනාගැනීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය / ගමන් බලපත්‍රය)
2. ලිපිනය සනාථ කිරීම (ජාතික හැඳුනුම්පත / උපයෝගීතා බිල්පත් / ග්‍රාම නිලධාරී සහතිකය )
3. ආදායම් සනාථ කිරීම (වැටුප් පත්‍රිකා / බැංකු ලේඛන / ආදායම් සනාථ කිරීම්)
4. ඇපකරු විස්තර - (ජාතික හැඳුනුම්පත / උපයෝගීතා බිල්පත් / ආදායම් සනාථ කිරීම්)
5. වාහන විස්තරය - සැපයුම්කරුගේ විස්තරය / වාහන විස්තර

ආයතනික ගණුදෙනුකරුවන් සඳහා

1. හඳුනාගැනීමේ සාක්ෂි (ව්‍යාපාර සංස්ථාපන සහතිකය ආකෘති අංක 41 හෝ 1 )
2. ලිපින සනාථ කිරීම - ආකෘති අංක 13
3. ආදායම් සනාථ කිරීම - (මූල්‍ය ප්‍රකාශන / බැංකු ලේඛන / වෙනත් ආදායම් සනාථ කිරීම්)
4. ඇපකරු විස්තර - (හැඳුනුම්පත / උපයෝගීතා බිල්පත් / ආදායම් සනාථ කිරීම්)
5. වාහන විස්තරය - සැපයුම්කරුගේ විස්තර / වාහන විස්තර

නීතිමය ප්‍රතිපාදන

1990 අංක 3 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1946 අංක 6 දරණ උකස් පනත.

පොලී අනුපාත

ණය පහසුකම සඳහා අදාල වන ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ, ණය පහසුකමේ වර්ගය, කාලසීමාව, ගණුදෙනුකරුගේ ණය සුදුසුකම්

සහ ඇප සුරැකුම්වල ස්වභාවය  අනුව, වෙළඳපොල තත්වයන් මත පදනම්ව පොලී අනුපාතය වරින් වර සංශෝධනය කෙරේ.

අයකිරීම්

මූල්‍ය කල්බදු පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාල වේ.

1. ණය තොරතුරු කාර්යාංශ ගාස්තු
2. වාහන පරීක්ෂණ ගාස්තු
3. තැපැල් ගාස්තු
4. මුද්දර ගාස්තු
5. වාහන ලියාපදිංචි ගාස්තු
6. රක්ෂණ වාරික

දණ්ඩන ගාස්තු අදාල වන්නේ දින 5 ක සහන කාලයකින් පසුවය. වාර්ෂික දණ්ඩන පොලී අනුපාතය 48% කි.

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

3. ප්‍රධාන කරුණු ලේඛණය :-  ශක්ති ව්‍යාපාර ණය සේවාව

**විස්තරය සහ අරමුණ**

ශක්ති ව්‍යාපාර ණය සැලසුම් කර ඇත්තේ මූල්‍ය අවශ්‍යතා සහිත ව්‍යාපාරික ප්‍රජාවේ අවශ්‍යතා සපුරාලීමටය. මෙම සේවාව මගින් ගණුදෙනුකරුවන්ට ඔවුන්ගේ කෙටිකාලීන මෙන්ම දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරා ගත හැකිය.

කෙටිකාලීන ''ශක්ති'' ව්‍යාපාර ණය

කාරක ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා පියවීම, කෙටිකාලීන ණය පියවීම සහ මාස 12 ක් ඇතුලත කළ හැකි වෙනත් අවශ්‍යතා හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා කෙටිකාලීන ''ශක්ති'' ව්‍යාපාර ණය ඉල්ලුම් කළ හැකිය.

දිගුකාලීන ''ශක්ති'' ව්‍යාපාර ණය

ව්‍යාපාර පුළුල් කිරීම සඳහා ආයෝජනයන්ට, නව ව්‍යාපාර අවස්ථා සඳහා ආයෝජනයට සහ දේපල අත්පත් කර ගැනීම / ගොඩනැගීමට ''ශක්ති'' දිගුකාලීන ව්‍යාපාර සඳහා ඉල්ලුම් කළ හැකිය.

ගණුදෙනුකරුවන්ට හිමිවන ප්‍රතිලාභ

''ශක්ති'' ව්‍යාපාර ණය යටතේ ගණුදෙනුකරුවන්ට පහත ප්‍රතිලාභ ලැබෙනු ඇත.

1. විචල්‍ය පොලී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීමේ හැකියාව
2. ප්‍රාග්ධනයෙන් කොටසක් අඩුවන පරිදි ප්‍රාග්ධනයට එරෙහිව ගෙවීම් සිදුකිරීමේ හැකියාව.
3. දේපල සහ වාහන ඇපකර ලබාදීමේ හැකියාව.

ඉලක්ක වෙළඳපල

ධනාත්මක මුදල් ප්‍රවාහයක් සහිත හෝ සාර්ථක ව්‍යාපෘති සහිත ව්‍යාපාරික ප්‍රජාව ඉලක්ක කර මෙම සේවාව සකසා ඇත.

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

ගණුදෙනුකරුවන්ට පහත විස්තර අතැතිව මෙම සේවාවට අයදුම් කල හැකිය.

1. හඳුනාගැනීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය / ගමන් බලපත්‍රය)
2. ලිපිනය සනාථ කිරීම (ජාතික හැඳුනුම්පත / උපයෝගීතා බිල්පත් / ග්‍රාම නිලධාරී සහතිකය )
3. ආදායම් සනාථ කිරීම් (වැටුප් පත්‍රිකා / බැංකු ලේඛන / ආදායම් සනාථ කිරීම්)
4. ඇපකරු විස්තර - (ජාතික හැඳුනුම්පත / උපයෝගීතා බිල්පත් / ආදායම් සනාථ කිරීම්)
5. ඇපකරු විස්තරය - වාහන / දේපල විස්තර

ආයතනික ගනුදෙනුකරුවන් සඳහා

1. හඳුනාගැනීමේ සාක්ෂි (ව්‍යාපාර සංස්ථාපන සහතිකය ආකෘති අංක 41 හෝ 1 )
2. ලිපින සනාථ කිරීම - ආකෘති අංක 13

3. ආදායම් සාක්ෂි - (මූල්‍ය ප්‍රකාශන / බැංකු ලේඛන / වෙනත් ආදායම් සනාථ කිරීම)

4. ඇපකරු විස්තර - (හැඳුනුම්පත / බිල් කිරීමේ සාක්ෂි / ආදායම් සනාථ කිරීම්)

5. ඇපකර විස්තරය - වාහන / දේපල විස්තර

නීතිමය ප්‍රතිපාදන

1990 අංක 3 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1946 අංක 6 දරණ උකස් පනත.

පොලී අනුපාත

සේවා සඳහා අදාල වන ස්ථාවර විචල්‍ය පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ ලබාදෙන පහසුකම, සේවා කාලය, ගණුදෙනුකරුගේ ණය සුදුසුකම සහ ලබාදෙන ඇප ආරක්ෂාව මතය. වෙළඳසැල තත්වයන් මත පදනම්ව අපගේ පොලී අනුපාත වරින්වර සංශෝධනය කෙරේ.

අයකිරීම්

මූල්‍ය කල්බදු පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාල වේ.

1. ණය තොරතුරු කාර්යාංශ ගාස්තු
2. වාහන පරීක්ෂණ ගාස්තු
3. තැපැල් ගාස්තු
4. මුද්දර ගාස්තු
5. වාහන ලියාපදිංචි ගාස්තු
6) උකස් ගාස්තු (අදාල නම් පමණි.)
7) නීතිමය ගාස්තු (අදාල නම් පමණි)
8) අවලංගු කිරීමේ ගාස්තු (අදාල නම් පමණි)
9) ණය ආරක්‍ෂණ රක්‍ෂණ ගාස්තු

දණ්ඩන ගාස්තු අදාල වන්නේ දින 5 ක සහන කාලයකින් පසුවය. වාර්ෂික දණ්ඩන පොලී අනුපාතය 48% කි.

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

**4.** ප්‍රධාන කරුණු ලේඛණය :- ''ශාස්ත්‍ර'' අධ්‍යාපන ණය

**විස්තරය සහ අරමුණ**

ශාස්ත්‍ර අධ්‍යාපන ණය සැලසුම් කර ඇත්තේ ගණුදෙනුකරුවාට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් සඳහා සහය වීමටය.

අරමුණ
ගණුදෙනුකරුවනට ඔවුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම ණය අයදුම් කළ හැකිය. ගණුදෙනුකරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපන වියදම් සඳහා දේශීය හා විදේශීය ආයතන පියවීම සඳහා මෙම සේවාව භාවිතා කළ හැකිය.

ගණුදෙනුකරුවන්ට ප්‍රතිලාභ
''ශාස්ත්‍ර'' අධ්‍යාපන ණය යටතේ පාරිභෝගිකයන්ට පහත සඳහන් ප්‍රතිලාභ ලැබෙනු ඇත.

i. සැකසුම් ගාස්තු නොමැත.
ii. පියවීමේ ගාස්තු නොමැත.
iii වීසා ලබාගැනීම සඳහා සහය

ඉලක්ක වෙළඳපල
මූල්‍ය ආධාර අපේක්ෂා කරන සිසුන් සහ වෘත්තිකයන් මෙම සේවාවේ ඉලක්ක වෙළඳපල වේ.

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි
ගණුදෙනුකරුවන්ට පහත විස්තර අතැතිව මෙම සේවාවට අයදුම් කල හැකිය.

i. හඳුනාගැනීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය / ගමන් බලපත්‍රය)
ii. ලිපිනය සනාථ කිරීම (ජාතික හැඳුනුම්පත / උපයෝගීතා බිල්පත / ග්‍රාම නිලධාරී සහතිකය )
iii. ආදායම් සනාථ කිරීම (වැටුප් පත්‍රිකා / බැංකු ලේඛන / ආදායම් සනාථ කිරීම්)
iv. අධ්‍යාපන වැඩසටහන් විස්තරය

v. ඇපකරු විස්තර - (හැඳුනුම්පත / බිල් කිරීමේ සාක්ෂි / ආදායම් සනාථ කිරීම්)

vi. ඇපකර විස්තරය - වාහන විස්තරය හෝ දේපල විස්තර

vii. ශිෂ්‍ය අයදුම්කරුවන් සඳහා ඒකාබද්ධ අයදුම්පත් භාරකරුවෙකු සමඟ සකස් කල යුතුවේ.

නීතිමය ප්‍රතිපාදන

1990 අංක 3 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1946 අංක 6 දරණ උකස් පනත.

පොලී අනුපාත

සේවා සඳහා අදාල වන ස්ථාවර විචල්‍ය පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ ලබාදෙන පහසුකම, සේවා කාලය, ගණුදෙනුකරුගේ ණය සුදුසුකම සහ ලබාදෙන ඇප ආරක්ෂාව මතය. වෙළඳසැල තත්වයන් මත පදනම්ව අපගේ පොලී අනුපාත වරින්වර සංශෝධනය කෙරේ.

අයකිරීම්

මූල්‍ය කල්බදු පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාල වේ.

1. ණය තොරතුරු කාර්යාංශ ගාස්තු
2. වාහන පරීක්ෂණ ගාස්තු
3. තැපැල් ගාස්තු
4. මුද්දර ගාස්තු
5. වාහන ලියාපදිංචි ගාස්තු
6. උකස් ගාස්තු (අදාල නම් පමණි.)
7. නීතිමය ගාස්තු (අදාල නම් පමණි)
8. අවලංගු කිරීමේ ගාස්තු (අදාල නම් පමණි)
9. ණය ආරක්‍ෂණ රක්‍ෂණ ගාස්තු

   දණ්ඩන ගාස්තු අදාල වන්නේ දින 5 ක සහන කාලයකින් පසුවය. වාර්ෂික දණ්ඩන පොලී අනුපාතය 48% කි.

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

5. ප්‍රධාන කරුණු ලේඛනය :- **Quick Cash** පුද්ගලික ණය පහසුකම

**සේවාවේ විස්තරය සහ අරමුණ**

විස්තරය

මෙම **Quick Cash** පුද්ගලික ණය පහසුකම නිර්මාණය කර ඇත්තේ ස්ථිර වැටුප් ලබන සේවකයන් හට කරදරයකින් තොරව ඕනෑම මුල්‍ය අවශ්‍යතාවක් සඳහා ලබාගත හැකි ලෙසිනි.

අරමුණ

- නිවසක ඉදිකිරීම්, මිලදීගැනීම්, නැවත අලුත්කිරීම්, දිගුකිරීම්, අලුත්වැඩියාවන් හා නවීකරණයකිරීම්
- b. අධ්‍යාපනික අරමුණු
- c. විදේශ සංචාර
- d. මංගල උත්සව හා වෙනත් සමාජ උත්සව
- e. වෙනත් පෞද්ගලික අවශ්‍යතා (කල් පවතින පාරිභෝගික භාණ්ඩ, අභරණ ආදිය)

ගණුදෙනුකරුවන්හට හිමිවන ප්‍රතිලාභ

- මෙම **Quick Cash** පුද්ගලික ණය පහසුකම සඳහා පහත සඳහන් ප්‍රතිලාභ
- පාරිභෝගිකයාට ලැබේ.
- වාරික ඔබේ ආපසු ගෙවීමේ හැකියාව මත සැලසුම් කිරීමේ හැකියාව.
- ගෙවීම් සහතිකකිරීමේ ඇපකරුවන් ලෙස පෞද්ගලික ඇපකරුවන් දෙදෙනෙකු පමණක් අවශ්‍ය වීම.
- වෙනත් ණය පහසුකම්වල මෙන් නොව වැඩි කාලයක් අපතේ නො යවා තම මුල්‍ය අවශ්‍යතා පහසුවෙන් ඉටු කරගැනීමට හැකිවන සේ මෙම **Quick Cash** පුද්ගලික ණය පහසුකම සරල හා වේගවත් වේ.

ඉලක්ක වෙළඳපල

- රාජ්‍ය අංශයඃ

ස්ථිර කාර්ය මණ්ඩලයෙහි පත්වීම් ලැබ අවම වශයෙන් වසර 2ක සේවා කාලයක් තිබීම.

- පෞද්ගලික අංශයඃ

ස්ථිර කාර්ය මණ්ඩලයෙහි පත්වීම් ලැබ අවම වශයෙන් වසර 2ක සේවා කාලයක් තිබීම.

- ආයතනික/අධිකාරීන්/මණ්ඩල හා සෙසු අනුමත රාජ්‍ය ආයතනඃ

  එක් වසරක ස්ථිර සේවකයෙකු ලෙස හා අවම වශයෙන් වසර 2ක සේවා කාලයක් තිබීම.

- බැංකුකරුවන්, බලයලත් මූල්‍ය සමාගම් හා කොටස් වෙළෙඳපොල ශ්‍රේණිගත සමාගම්ඃ

  එක් වසරක ස්ථිර සේවකයෙකු ලෙස හා අවම වශයෙන් වසර2ක සේවා කාලයක් තිබීම.

- පීපල්ස් ලීසිං සමාගමේ අනුමත සෙසු සමාගම්ඃ

ස්ථිර සේවයෙහි වසර 2ක් හිමි හා වසර 4ක සේවා කාලයක් තිබීම

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

- අවම ණය මුදල රුපියල් 50,000/-කි.
- උපරිම ණය මුදල රුපියල් 1,500,000/- (රුපියල් මිලියන 1.5කි.)
- කාලයඃ

රුපියල් 100,000/- දක්වා මාස 24කි.

රුපියල් 500,000/- දක්වා මාස 36කි.

රුපියල් 500,000/- වැඩි මාස 48කි.

- ඇපකරුවෝ
- පළමු ඇපකරුවා ණය අයදුම් කරන්නා සේම එකම සේව්‍යයෙකු යටතේ සේවය කළ යුතුය.
- පීපල්ස් ලීසිං සමාගමේ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කිරීම අනිවාර්යය වේ.

නීතිමය ප්‍රතිපාදන

සමර්ථයකට පත් කිරීමේ පණත

පොලී අනුපාත

ණය මුදල සඳහා ස්ථාවර පොලී අනුපාතයක් අදාල වේ. ණයට දීමේ අනුපාතය ණය කාල සීමාව අනුව වෙනස් වේ. වෙළෙඳපොල තත්ත්වය මත අපේ පොලී අනුපාතයන් කාලයෙන් කාලයට වෙනස් වේ

අයකිරීම්

- ක්‍රියාවලි ගාස්තු.
- ණය තොරතුරු ගාස්තු.
- රක්ෂණ ගාස්තු

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

**6.** ප්‍රධාන කරුණු ලේඛනය :- **Fast Track**

**සේවාවේ විස්තරය සහ අරමුණ**

ගණුදෙනුකරුවන්ගේ කාරක ප්‍රාග්ධනය ඇතුළු ව හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීමට නිර්මාණය කළ කෙටිකාලීන ණය පහසුකමකි. මෙම **Fast Track** සඳහා ඉලක්කගත වෙළෙඳපොල වන්නේ විශිෂ්ට ණයගෙවීමේ වාර්තා හා ඉතිහාසයක් හිමි හෝ විශේෂිත අවස්ථාවක් පෙන්නුම්කරන පවතින ගනුදෙනුකරුවන් හෝ විශිෂ්ට මූල්‍ය පදනමක් හිමි නව ගණුදෙනුකරුවන් වේ.

ගණුදෙනුකරුවන්හට හිමිවන ප්‍රතිලාභ

අනුමත ණය කාලසීමාව තුළ ලබාදුන් කාලය ඇතුළත ණය මුදල ගෙවා නැවත ලබාගැනීමේ හැකියාව පාරිභෝගිකයාට ලැබේ. කෙසේ හෝ මෙම ක්‍රමවේදය පවත්වාගෙන යා හැක්කේ එක ගිණුමක් හා එක් පහසුකමක් සඳහා පමණි. අනුමත සම්පූර්ණ ණය මුදල එක්වරම හෝ පසුව සිදුකෙරෙන මුදල් ලබාගැනීම් ලෙස ප්‍රයෝජනයට ගැනීමට ගණුදෙනුකරුවන්ට හැකියාව තිබේ. එම සියලු මුදල් ආපසුගැනීම් සැලකෙන්නේ එකම ණය පහසුකමක් යටතේ සිදුකරන බහුවිධ මුදල් ගැනීම් ලෙසිනි. (වෙනත් උප ණයක් ලෙසින් නොවේ) එමෙන්ම එය අප ගිණුම් ක්‍රමවේදයෙහි පෙන්නුම් කරන්නේද එකම ණය පහසුකමක් ලෙසිනි.

ඉලක්ක වෙළඳපල

විශිෂ්ට ණය ඉතිහාසයක් සහිත ඕනෑම පවතින පාරිභෝගිකයෙකු/ආයතනික/ව්‍යාපාරිකයෙකුට මෙම **Fast Track** ණය පහසුකමට අයදුම්කිරීමට සුදුසුකම් ලබයි. කෙසේ හෝ හදිසි මුදල් අවශ්‍යතාවක් හෝ ව්‍යාපාරික ප්‍රාග්ධන අවශ්‍යතාවක් තිබෙනබව සනාථ කෙරෙන (සාධාරණීකරණය කෙරෙන) ලියකියවිලි අදාල පාරිභෝගිකයා විසින් ඉදිරිපත් කළ යුතු වේ.

විශිෂ්ට මූල්‍ය පසුබිමක් සහිතබව සනාථකරන නව පාරිභෝගියෙකුව විශේෂිත තත්ත්වයක් සේ සැලකේ.

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

- උපරිම ණය කාල සීමාව වසර දෙකකි. (අවම ණය කාල සීමාව තෙමසකි)
- ඇපයක් පදනම් කරගත් (චංචල හෝ නිශ්චල) ණය පහසුකම් සඳහා ඇප ඔප්පුවක් ආදේශ කළ හැක.
- උපරිම ණය මුදල රුපියල් 5,000,000/-කි. අවම ණය මුදල රුපියල් 1,000,000/-කි.
- අවම ගෙවීම (මාසික පදනම) = ගෙවීමට තිබෙන ප්‍රාග්ධන මුදල මත පොලිය වේ.
- එක්වර වැඩි මුදලක් (ප්‍රාග්ධන ගෙවීමෙන් කොටසක්) ගෙවීමෙන් ගෙවීමට තිබෙන ප්‍රාග්ධනයෙන් කොටසක් අඩුකිරීමේ හැකියාව පාරිභෝගිකයා ට හිමිවන විකල්පයකි.

- ප්‍රධාන ණය පහසුකමට ලැබෙන කාලය ණය අනුමතවූදා සිට දෙවසරකි.

- අවම කාලය මාස තුනකි.

නීතිමය ප්‍රතිපාදන

1990 පණත් අංක 03 සේ සංශෝධිත 1946 අංක 06 උකස් පණත

පොලී අනුපාත

ස්ථාවර පොලී අනුපාතයකි. වෙළෙඳපොල තත්ත්වය පදනම්ව අපේ පොලී අනුපාතයන් කාලයෙන් කාලයට වෙනස් වේ

අයකිරීම්

- 'පොරොන්දු පත්‍රයක ඉල්ලීම' මත ප්‍රධාන ණය මුදලෙහි සම්පූර්ණ වටිනාකමෙන් (0.1%) මුද්දර ගාස්තුවක් කලින් අය කෙරේ. එහෙයින් ණය මුදලෙන් කොටස් පසුව ආපසු ගන්නා විට මුද්දර ගාස්තුවක් අය නො කරයි.

- පාරිභෝගියා විසින් ණය මුදල සම්පූර්ණයෙන්ම ගෙවා නිමකරන විට හා අනුමත ණය කාලසීමාව තුළ ණය මුදල නැවත ලබාගන්නා විට මුද්දර ගාස්තු අය නො කෙරේ.

- පුද්ගල ණය සඳහා ණය තොරතුරු ගාස්තු, තැපැල් ගාස්තු, පාරිභෝගික/ව්‍යාපාරික විමර්ෂණ ගාස්තු, මෝටර්රථ දෙපාර්තමේන්තුවේ ගාස්තු, ණය මුදලෙහි ආරක්ෂිත රක්ෂණ ගාස්තු හා උකස් ගාස්තු අදාල වේ.

- මූලික ක්‍රියාවලි අවස්ථාවේ දී පමණක් මෙම සියලු ගාස්තු කලින් ගෙවීම අදාල වේ.

- චංචල වත්කම් (රථවාහන) සඳහා රක්ෂණ ගාස්තු ණය කාලසීමාව තුළදී වාර්ෂිකව ගෙවිය යුතු වේ.

- ලියකියවිලි/ක්‍රියාවලි ගාස්තු හා කළින් ගෙවා නිමකිරීමේ ගාස්තු ආදල නොවේ.

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

7. ප්‍රධාන කරුණු ලේඛනය :- නිවාස ණය ''සැනසුම් පියස''

**සේවාවේ විස්තරය සහ අරමුණ**

විස්තරය

සාම්ප්‍රදායක නොවන නම්‍යශීලී ණය විශේෂාංග සමඟ ඔබේ අවශ්‍යතාවයට සරිලන පරිදි පීඑල්සී ''සැනසුම් පියස'' නිවාස ණය නිර්මාණය කර ඇත්තේ වත්කම් වෙනස්වීම නිසා හෝ වත්කම විකුණනු ලැබුවහොත් ණය පහසුකම් පියවා ගැනීමට / අවසාන කිරීමට අවශ්‍ය නොවන පරිදිය. මෙම නිවාස ණය පහසුකම මගින් ණය ගැනුම්කරු ආදේශ කිරීම, වත්කම් ප්‍රතිස්ථාපනය කිරීම, වසර 5 ක් දක්වා සහන කාල සීමාව, නම්‍යශීලි ආපසු ගෙවීමේ ක්‍රම සහ ඔබේ සිහින නිවහන යථාර්ථයක් බවට පත්කිරීම සඳහා ප්‍රාග්ධන කොටස බේරුම් කිරීම ඇතුලු බහුකාර්ය මූල්‍ය විසඳුම් රැසක් ඉදිරිපත් කරයි.

අරමුණ

පහත සඳහන් අරමුණු සඳහා ''සැනසුම් පියස'' නිවාස ණය සලකා බලනු ලැබේ.

i. හිස් ඉඩමක් මිලදී ගැනීම

ii නිවාස ඉදිකිරීම, නවීකරණය කිරීම

iii. පදිංචිය සඳහා හෝ ආයෝජන අරමුණු සඳහා ඉදිකරන ලද හෝ ඉදිකරමින් පවතින නිවාස හෝ නිවාස සඳහා.

ගණුදෙනුකරුවන්හට හිමිවන ප්‍රතිලාභ

i. උපරිම මාස 60 ක් දක්වා හිමිවන ප්‍රාග්ධන ණය සහන කාලසීමාව

ii. වසර 15 ක් දක්වා හිමිවන ණය ආපසු ගෙවීමේ කාලසීමාව

iii. වැඩකරන දින 3 ක් ඇතුලත ණය අනුමත කිරීම

iv ණය ආපසු ගෙවීමේ හැකියාව අනුව ණය වාරිකය සැලසුම් කරගැනීමේ හැකියාව

v ඕනෑම විටක ණය මුදල අර්ධ වශයෙන් ගෙවා දැමීම මගින් ණය වාරිකය හෝ ණය ආපසු ගෙවීමේ කාලසීමාව අඩුකර ගැනීමේ හැකියාව.

vi ඉඩම් ලේඛනයෙන් උපුටා ගැනීම්, කෙටුම්පත් ඔප්පුව, පළාත් පාලන ආයතන ලේඛන වැනි අවශ්‍ය ලිපි ලේඛන ලබාගැනීමට සහාය වීම (වීදි රේඛා, පවර නොගැනීම, හිමිකාරිත්වය)

vii විශේෂයෙන් සකස් කරන ලද ණය පහසුකම්, අවම ලියකියවිලි, වේගවත් හා කරදරයකින් තොරව ඔබ කරා පැමිණ ලබාදෙන සේවාව.

viii ණය ආපසු ගෙවීමේ හැකියාව ගණනය කිරීමේදී වර්තමාන සහ අනාගත ආදායම සලකා බැලීම.

ix ණය කාල සීමාව තුල වත්කම් (ඇප සුරැකුම) ප්‍රතිස්ථාපනය කිරීමට සහ අමතර ගාස්තුවකින් තොරව එකම නියමයක් හා කොන්දේසි යටතේ ණය ගිවිසුම ඉදිරියට ගෙනයාමේ නිදහස.

x ණය ගිවිසුමට අදාල වත්කමේ අයිතිය වෙනත් කෙනෙකුට පැවරීමේ නිදහස.

ඉලක්ක වෙළඳපල

ප්‍රමාණවත් ආපසු ගෙවීමේ හැකියාවක් ඇති රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවකයින්, වෘත්තිකයන්, ව්‍යාපාරිකයන්, ව්‍යවසායකයින් ඇතුලු ස්ථාවර ආදායම් මාර්ගයක් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

අයදුම්කරු පැහැදිලි ණය තොරතුරු කාර්යාංශයේ වාර්තා (CRIB) සහිත ප්‍රමාණවත් ණය ආපසු ගෙවීමේ හැකියාවක් සහිත වයස අවුරුදු 18 ත් 60 ත් අතර ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

උකස් ණය පහසුකම් ලබාදීමේදී සලකා බැලිය යුතු ඉඩම් ප්‍රමාණයන් සීමාව, පළාත් පාලන අධිකාරියේ නීතියෙන් (මහ නගර සභාව, නගර සභාව සහ ප්‍රාදේශීය සභාව) නියමකර ඇති පරිදි ඉඩමේ අවම ප්‍රමාණයට සමාන හෝ වැඩිවිය යුතුය. ඉහත පළාත් පාලන අධිකාරියේ නීතිවලට කරන ලද සංශෝධන අනුව ප්‍රමාණයන් වරින් වර වෙනස් විය හැකිය.

අවශ්‍ය ලියකියවිලි

- ★ නිසි පරිදි සම්පූර්ණ කරන ලද ''සැනසුම් පියස'' නිවාස ණය අයදුම්පත
- ★ ජාතික හැඳුනුම්පතේ පිටපත
- ★ ආදායම සහතික කරන ලේඛන

★ දේපල සම්බන්ධ ලිපි ලේඛන (හිමිකම් ඔප්පුව, මිනුම් සැලැස්ම ආදිය)

නීතිමය ප්‍රතිපාදන

1990 අංක 3 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1949 අංක 6 දරණ උකස් පනත

පොලී අනුපාත

ණය පහසුකම සඳහා අදාල වන ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ, ණය පහසුකමේ වර්ගය, කාලසීමාව, ගණුදෙනුකරුගේ ණය සුදුසුකම් සහ ඇප සුරැකුම්වල ස්වභාවය මත වෙළඳසැල් තත්වයන් මත පදනම්ව පොලී අනුපාතය වරින් වර සංශෝධනය කෙරේ.

අයකිරීම්

''සැනසුම් පියස'' නිවාස ණය සඳහා පහත සඳහන් ගාස්තු අදාල වේ.

i ණය තොරතුරු කාර්යාංශයේ ගාස්තු

ii. වාහන / දේපල පරීක්ෂා කිරීමේ ගාස්තු

iii තැපැල් ගාස්තු

iv මුද්දර බදු

v උකස් ගාස්තු

vi නෛතික ගාස්තු

vii ණය ආරක්ෂණ රක්ෂණය අදාල වන්නේ නම් දණ්ඩන ගාස්තු අදාල වන්නේ සහන කාල සීමාවෙන් දින 5 කට පසුව පමණි. දණ්ඩන පොලී අනුපාතය වාර්ෂිකව 48%.

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

**8.** ප්‍රධාන කරුණු ලේඛනය :- රන් ණය

**සේවාවේ විස්තරය සහ අරමුණ**

විස්තරය
ඔබගේ මූල්‍ය අවශ්‍යතා සඳහා කඩිනම් සහ පහසු විසඳුමක් ලෙස ඔබගේ රන් භාණ්ඩ උපරිම වටිනාකමකට උපයෝගී කර ගැනීම.

අරමුණ
හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා මූල්‍ය විසඳුමක් ලබාදීම.

ගණුදෙනුකරුවන්හට හිමිවන ප්‍රතිලාභ

i. රන් භාණ්ඩ සඳහා වැඩිම අත්තිකාරම් මුදලක්
ii. රන් ණය වෙළඳපලේ පවතින අවම පොලී අනුපාත යටතේ ණය ලබාදීම.
iii. සැඟවුණු / අමතර ගාස්තු අය නොකෙරේ.
iv. ඔබගේ කැමැත්ත පරිදි පහසු වාරිකවලින් ණය මුදල ගෙවා දැමීමේ හැකියාව.
v. මාස 1 - 3 - 6 සහ 12 දක්වා තෝරා ගැනීමට පහසු ගෙවීම් ක්‍රම රැසක්
vi. රන් භාණ්ඩ සඳහා නොමිලේ රක්ෂණ ආවරණයක්
vii. කල් පිරීමේදී අවම පොලී මුදල ගෙවීම මගින් ණය කාලසීමාව දීර්ඝ කරගැනීමේ හැකියාව
viii. වෙන් වෙන් වශයෙන් රන් ණය පහසුකම් කිහිපයක් ලබාගෙන ඇති විටක, එක් එක් වශයෙන් භාණ්ඩ බේරාගැනීමේ හැකියාව.
ix. පළපුරුදු, මිත්‍රශීලී සහ හොඳින් පුහුණු වූ සේවක මණ්ඩලයක් විසින් ලබාදෙන සේවාව.
x. කල් පිරීමේ දිනයට පෙර ඊ-මේල් මගින් දැනුම් දීම.

ඉලක්ක වෙළඳපල

මෙම සේවාව ස්වර්ණාභරණ නිෂ්පාදකයින්, උකස් තැරැව්කරුවන් සහ ස්වර්ණාභරණ වෙළඳසැල් හිමිකරුවන්ගෙන් සමන්විත ආයෝජන සහ තනි පුද්ගල යන අංශ දෙකටම නිර්මාණය කර ඇත.

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

එන් මිශ්‍රණය කැරට් 16 ට නොඅඩු හෝ 67% සංශුද්ධතාවයට නොඅඩු විය යුතුය. රන් කාසි, රන් බිස්කට්, රන් බාර්, කුට්ටි හෝ මූස් කල රත්රන් ද ඉතා පරිස්සමෙන් හා නිසි ක්‍රමවේදයන්ට යටත්ව පිළිගත හැකිය. රන් ණය අයදුම්පත්‍රය සහ ජාතික හැඳුනුම්පතේ පිටපත.

නීතිමය ප්‍රතිපාදන

1990 අංක 3 දරන පනත මගින් සංශෝධනය කරන ලද 1949 අංක 6 දරන උකස් පනත

පොලී අනුපාත

ණය පහසුකම සඳහා අදාල වන ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ, ණය පහසුකමේ වර්ගය, කාලසීමාව, ගණුදෙනුකරුගේ ණය සුදුසුකම් සහ ඇප සුරැකුම්වල ස්වභාවය මත වෙළඳසැල් තත්වයන් මත පදනම්ව පොලී අනුපාතය වරින් වර සංශෝධනය කෙරේ.

අයකිරීම්

කිසිදු අයකිරීමක් සිදු නොකෙරේ.

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

9. ප්‍රධාන කරුණු ලේඛනය :- ආන්තික වෙළඳාම

**සේවාවේ විස්තරය සහ අරමුණ**

විස්තරය

කොටස් හා ණය වෙළඳපොලේ ආයෝජකයින්ට ඔවුන්ගේ ආයෝජනය මත පදනම්ව මූල්‍ය පහසුකමක් ලබාගැනීමටත්, ඔවුන්ගේ ආයෝජන කළඹ තවදුරටත් ගොඩනගා ගැනීමටත්, අතිරේක සුරැකුම්පත් වෙළඳාම් කිරීමටත් ඉඩ සලසන සේවාවකි.

අරමුණ

ආයෝජන කළඹ ඇප සුරැකුමක් ලෙස තබාගනිමින් ගණුදෙනුකරුවන්ට ඔවුන්ගේ ආයෝජන කළඹ වැඩිකර ගැනීමටත්, වෙළඳාම් කිරීමටත් අවස්ථාව සලසාදීම වේ.

ගණුදෙනුකරුවන්හට හිමිවන ප්‍රතිලාභ

ගණුදෙනුකරුවන්ට ප්‍රතිලාභ

- ⋆ ගිණුම් තත්වය පිළිබඳ දිනපතා යාවත්කාලීන කිරීම - කොටස් මිලදී ගැනීමේ හැකියාව ක්ෂණිකව වැඩි කිරීම.
- ⋆ ලාභාංශ වැඩි කිරීම සහ වෙළඳ ලාභ වැනි ආදායම් අවස්ථා
- ⋆ පවත්නා කොටස් විකිණීමෙන් තොරව හෝ අතිරේක ප්‍රාග්ධන ආයෝජනයකින් තොරව සුරැකුම්පත් වෙළඳපලෙහි නව ආයෝජන මාර්ගයක් භාවිතා කිරීම.
- ⋆ ඕනෑම ලියාපදිංචි තැරැව්කරුවෙකු හරහා සපයනු ලබන පහසුකම් අවම ලිපිකරණය හා ක්ෂණික අනුමැතිය
- ⋆ දිනපතා ශේෂය මත පොලී ගණනය කර ගිණුමට බැර කිරීම.

ඉලක්ක වෙළඳපොල

තනි පුද්ගල, ඉහළ ශුද්ධ වටිනාකම සහ ආයතනික ආයෝජනයන්

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

- ⋆ ආයෝජන කළඹ රු. 500,000 කට වඩා වැඩි විය යුතුය.
- ⋆ ජාතික හැඳුනුම්පත

- ලිපිනය තහවුරු කිරීම සඳහා බිල්පත්
- ආන්තික වෙළඳ ගිවිසුම (ත්‍රෛපාර්ශවීය)
- ගිණුම විවෘත කිරීමේ අයදුම්පත්‍රය සහ KYC

නීතිමය ප්‍රතිපාදන

1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසමේ වගන්ති 19 යටතේ ආන්තික සැපයුම්කරුවකු වශයෙන්

සේවාලාභියා සමග - ආන්තික වෙළඳ ගිවිසුම සඳහා

පොලී අනුපාතය

ණය පහසුකම සඳහා අදාල වන ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ, ණය පහසුකමේ වර්ගය, කාලසීමාව, ගණුදෙනුකරුගේ ණය සුදුසුකම් සහ ඇප සුරැකුම්වල ස්වභාවය මත වෙළඳසැල් තත්වයන් මත පදනම්ව පොලී අනුපාතය වරින් වර සංශෝධනය කෙරේ.

අයකිරීම්

අනුමැතිය ලබාගැනීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු ගාස්තු එකතු කල අගය මත බදු :VAT

මාසික පදනම මත හර බද්ද

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

**10.** ප්‍රධාන කරුණු ලේඛනය :- ණය සාධ්‍යකරණය

**සේවාවේ විස්තරය සහ අරමුණ**

විස්තරය -

ලැබිය යුතු මූලපකරණය

අරමුණ -

කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම

ගනුදෙණුකරුවන්ට හිමිවන ප්‍රතිලාභ

- ★ ගනුදෙණුකරුවන්ගේ අවශ්‍යතාවය පරිදි කාරක ප්‍රාග්ධන පහසුකම් සැපයීම
- ★ ඉන්වොයිසි / චෙක්පත්වල මුහුණත වටිනාකමෙන් 70% සිට 85% දක්වා අත්තිකාරම්
- ★ විකුණුම් ලෙජරය (ණයගැති ගිණුම) කළමනාකරණය කිරීම.
- ★ විශේෂඥ උපදෙස් සැපයීම.
- ★ හදිසි කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා ක්ෂණික අනුමැතිය.

ඉලක්ක වෙළඳපල

ආයතනික, අර්ධ ආයතනික සහ කුඩා හා මධ්‍ය පරිමාණ ගනුදෙනුකරුවන්

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

- ★ සාංඝමික සංස්ථාපනය හා සාංඝමික ව්‍යවස්ථාවලිය
- ★ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත
- ★ පසුගිය මාස 6 බැංකු ප්‍රකාශන
- ★ පෝරම 20 නවතම පිටපත
- ★ පසුගිය වසර 3 ක විගණනය කරන ලද මූල්‍ය කටයුතු
- ★ ණය ගැතියන්ගේ ලැයිස්තුව
- ★ ණයගැති කාලසීමාව පිළිබඳ විශ්ලේෂණය
- ★ අයදුම්කරුවන්ගේ සහ ඇපකරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපත්
- ★ එකතු කල අගය මත බදු (VAT) ලියපදිංචිවීමේ සහතිකයේ පිටපත
- ★ පසුගිය මාස 6 ක පිරිවැටුම් විස්තරය

නීතිමය ප්‍රතිපාදන
අදාල නොවේ.

පොලී අනුපාතය
ණය පහසුකම සඳහා අදාල වන ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ, ණය පහසුකමේ වර්ගය, කාලසීමාව, ගණුදෙනුකරුගේ ණය සුදුසුකම් සහ ඇප සුරකුම්වල ස්වභාවය මත වෙළඳසැල් තත්වයන් මත පදනම්ව පොලී අනුපාතය වරින් වර සංශෝධනය කෙරේ.

අය කිරීම්
පරිපාලන ගාස්තු සහ වෙනත් අයකිරීම් (උදා :- ලිපිකරණ ගාස්තු යනාදිය) සඳහා ඉන්වොයිස් වටිනාකමින් 0.5% සිට 0.75% දක්වා

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

**ඉස්ලාමීය සේවාවන්**

ප්‍රධාන කරුණු ලේඛනය

**11.** ඉජාරා / ඉස්ලාමීය කල්බදු සේවාවේ විස්තරය සහ අරමුණු

විස්තරය - ඉජාරා / ඉස්ලාමීය කල්බදු
ඉජාරා යනු, කිසියම් දේපලක හිමිකරු (බදුකරු) විසින් කුලී පදනම මත භාවිතා කරන වෙනත් පුද්ගලයෙකු හට (කුලීකරු) වෙත පැවරීමයි.

අරමුණ -
ලියාපදිංචි නොකල වාහන, ලියාපදිංචි වාහන, යන්ත්‍ර සහ උපකරණ සඳහා ඉජාරා කල්බදු ලබාදිය හැක.

ගනුදෙණුකරුවන් හට හිමිවන ප්‍රතිලාභ

- ★ නම්‍යශීලී ආපසු ගෙවීම
- ★ රක්ෂණය මුලදී හෝ වාරික මුදලට එකතු කරගැනීමේ හැකියාව
- ★ වත්කම් ප්‍රතිස්ථාපනය
- ★ මූල්‍ය පහසුකමේ කාලයවැඩිකර ගැනීම හෝ වාරික මුදල අඩුකර ගැනීමේ හැකියාව
- ★ කළමනාකරණයේ අනුමැතියට යටත්ව බදුකරු වෙනස් කල හැකිවීම.

ඉලක්ක වෙළඳපල
- ★ තනි පුදලයින් / වෘත්තිකයන්
- ★ ආයතනික පුරවැසියන්
- ★ ව්‍යාපාරිකයන්

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි
ඉජාරා යනු මූලික වශයෙන් පිරිනැමීමක් සහ පිළිගැනීමක් අවශ්‍ය වන ගිවිසුමකි. පිරිනැමීම බදුකරු මෙන් හෝ කුලී කරුගෙන් විය හැකි අතර පිළිගැනීම බදුලාභියා හෝ කුලී ලාභියා විය හැක. මෙය දෙආකාරයෙන්ම සිදු විය හැක.

- ★ ඉජාරා ගිවිසුම එකිනෙකාගේ අවසරයකින් තොරව අවසන් කිරීමට හෝ වෙනස් කිරීමට නොහැක.
- ★ ඉජාරා ගිවිසුම වලංගු වීමට නම් කල්බදු විෂයට වටිනාකමක් තිබිය යුතුය. එම නිසා කිසිදු උපයෝගීතාවයක් නැති වස්තුවක් බදු දීමට නොහැකිය.
- ★ බදු ගැනුම්කරු බදු කැ වෙනුවෙන් බදු වස්තුව සිය බාරයේ තබා ගනියි. හිමිකාරත්වය තුලින් මතුවන සියලු වගකීම් බදුකරු විසින් දරාගත යුතුය. දේපල පරිහරණය කිරීම නිසා ඇතිවන වගකීම් බදුගැනුම්කරු විසින් දරාගත යුතුය.

අවශ්‍ය ලේඛන
- i. ඔහුගේ / ඇයගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්
- ii. සංස්ථාවක් නම්, අධ්‍යක්ෂකවරුන්ගේ ජාතික හැඳුනුම්පත්, සංගමික ව්‍යවස්ථාවලිය, ආකෘති 40, 41 හා 20 සහ ඉජාරා පහසුකම ලබාගැනීමට ෂරීඅ හි අවසර ඉල්ලා ඇති අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනා පත්‍රය
- iii. ලිපිනය සනාථ කිරීමට බිල්පත් සාක්ෂි
- iv. චංචල වත්කම් සඳහා මෑතකදී ලබාගත් තක්සේරු

v. සේවයේ යෙදී සිටින්නෙකුනම් සේවා යෝජකගෙන් සනාථ කරගත් වැටුප් විස්තරය, අඩු කිරීම්, ශුද්ධ වැටුප සහ විශ්‍රාමික දිනය

vi. ආදායම් සනාථයන් (බැංකු විස්තරය, විගණිත හෝ කලමනාකරණ ගිණුම්)

vii. බදු ගෙවන්නෙකු නම්, පසුගිය වසර 3 සඳහා ලැබීම් සහ ගෙවීම්, ලිපිගොනු අංකය.

viii. සමිති සංවිධානයක් නම් ඉජාරා පහසුකම ලබාගැනීමට ඡන්ද වෙතින්, ඉල්ලුම් කල කලමනාකරණ කමිටු වාර්තාව

ix භාරයක් නම් IFSU වෙත ඉල්ලුම් කල භාරකාර ඔප්පුවේ පිටපතක්

නීතිමය ප්‍රතිපාදන

2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පණත

ලාභ අනුපාත

සේවා සඳහා අදාල වන ස්ථාවර විචල්‍ය ලාභ අනුපාත තිරණයකරනු ලබන්නේ ලබාදෙන පහසුකම, සේවා කාලය, ගනුදෙනුකරුගේ ණය සුදුසුකම සහ ලබාදෙන ඇප ආරක්ෂාව මතය. වෙළඳපල තත්වයන් මත පදනම්ව අපගේ ලාභ අනුපාත වරින්වර සංශෝධනය කෙරේ.

අය කිරීම්

- ලේඛණ ගාස්තු (තැපැල්, ණය කාර්යාංශය, අධීක්ෂණ)
- මෝටර් රථ ලියාපදිංචි ගාස්තු අදාල නම්
- රක්ෂණ ගාස්තු
- මුද්දර බදු, මුළු ලැබිය යුතු මුදලින් 1%
- පුණ්‍ය කටයුතු සඳහා වෙන් කිරී 18% ක වාර්ෂික අනුපාතයකට.

පෙර නිමිති ගාස්තු වාර්ෂිකව 12%

ප්‍රධාන කරුණු ලේඛණය - මුරබාහ සහ ට්‍රේඩින් මුරබාහ සේවාවේ විස්තරය සහ අරමුණ

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

**12.** මුරබාහ සහ ට්‍රේඩින් මුරබාහ හි අරමුණ

දේපලක් විකිණීමේදී විකුණුම්කරු (පීඑල්සී) එම දේපල අත්පත් කර ගැනීමට දරූ සත්‍ය පිරිවැය ගැනුම්කරු (ගනුදෙනුකරු) දැනුවත් කරන අතර ලාභයද සඳහන් කරයි. වැදගත් ලක්‍ෂණ :-

★ විකිණීමට ඇති වත්කම පැවතිය යුතුය.

★ විකුණුම් මිල තීරණය කල යුතුය.

★ විකිණීම කොන්දේසි විරහිත විය යුතුය.

★ ගැනුම් ඇනවුම්කරුට මුබාහව යනු මිලට ගැනීමට උනන්දුවක් දක්වන යම් ආයතයක් හෝ පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකු හෝ ආයතනයක් හරහා මිලට ගැනීමට පෙර පොරොන්දුවක් දී ඇති මුරබාහවකි.

★ මිලදී ගැනීම් මුරබාහවකට පාර්ශව 3 කි. එනම් මිලට ගැනුම් ඇනවුම්කරු, ගැනුම්කරු සහ විකුණුම්කරුවේ.

★ මුරබාහ ගිවිසුම් 2 කින් යුක්ත වේ. පලමු ගිවිසුම ගැනුම්කරු හා විකුණුම්කරු අතරය දෙවන ගිවිසුම ගැනුම්කරු හා ගැනුම් ඇනවුම්කරු අතරය. විකුණුමක් පාලනය කරන සියලු නීති රෙගුලාසි මෙම විකුණුම් දෙකටම අදාල වේ. පළමු විකුණුම සම්පූර්ණ වූ පසු දෙව විකුණුම ආරම්භ වේ.

අරමුණ :- වෙළඳ භාණ්ඩ මිලදී ගැනීම
වත්කම් මිලට ගැනීම
වෙළඳ අරමුණ සඳහා භාණ්ඩ මිලදී ගැනීම
ලියාපදිංචි කල නොකල වාහන
උපකරණ තහවුරු කිරීම.

ගනුදෙණුකරුවනට ප්‍රතිලාභ

★ නම්‍යශීලී ආපසු ගෙවීම

★ ආරක්‍ෂක ප්‍රතිස්ථාපනය

ඉලක්ක වෙළඳපල

★ සංස්ථා ★ ව්‍යාපාර ★ පුද්ගලයින්

ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

i. ඔහුගේ / ඇයගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්
ii. සංස්ථාවක් නම්, අධ්‍යක්ෂකවරුන්ගේ ජාතික හැඳුනුම්පත්, සංගමික ව්‍යවස්ථාවලිය, ආකෘති 40, 41 හා 20 සහ ඉජාරා පහසුකම ලබාගැනීමට ඡන්ද හි අවසර ඉල්ලා ඇති අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනා පත්‍රය
iii. ලිපිනය සනාථ කිරීමට බිල්පත් සාක්ෂි
iv. සේවයේ යෙදී සිටින්නෙකුනම් සේවා යෝජකගෙන් සනාථ කරගත් වැටුප් විස්තරය, අඩු කිරීම්, ශුද්ධ වැටුප සහ විශ්‍රාමික දිනය
v ආදායම් සනාථයන් (බැංකු විස්තරය, විගණිත හෝ කලමනාකරණ ගිණුම්)
vi. බදු ගෙවන්නෙකු නම්, පසුගිය වසර 3 සඳහා ලැබීම් සහ ගෙවීම්, ලිපිගොනු අංකය.
vii. සමිති සංවිධානයක් නම් ඉජාරා පහසුකම ලබාගැනීමට ඡන්ද වෙතින්, ඉල්ලුම් කල කලමනාකරණ කමිටු වාර්තාව
viii. භාරයක් නම් IFSU වෙත ඉල්ලුම් කල භාරකාර ඔප්පුවේ පිටපතක්

නීතිමය ප්‍රතිපාදන

2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පණත

ලාභ අනුපාත

සේවා සඳහා අදාල වන ස්ථාවර විචල්‍ය ලාභ අනුපාත තිරණයකරනු ලබන්නේ ලබාදෙන පහසුකම, සේවා කාලය, ගනුදෙනුකරුගේ ණය සුදුසුකම සහ ලබාදෙන ඇප ආරක්ෂාව මතය. වෙළඳපල තත්වයන් මත පදනම්ව අපගේ ලාභ අනුපාත වරින්වර සංශෝධනය කෙරේ.

අය කිරීම්

මුරබාහ වාහන

★ ලේඛන ගාස්තු
★ මුද්දර බදු - මුළු ලැබිය යුතු මුදලින් 1%
★ මෝටර් රථ ලියාපදිංචි ගාස්තු (අදාල නම් පමණි)

මුරබාහ වෙළඳාම රක්ෂණ ගාස්තු

★ ලේඛන ගාස්තු
★ ඇපකරය නිශ්චල දේපලක් නම් උකස් ගාස්තු සහ නීති ගාස්තු
★ මුද්දර බදු 0 - 1% (අදාල නම් පමණි)

- ★ පරීක්ෂණ ගාස්තු
- ★ පුණ්‍ය කටයුතු සඳහා 18% ක වාර්ෂික වෙන් කිරීම.

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

**13.** ප්‍රධාන කරුණු ලේඛනය :- මුෂාරකා

**නිෂ්පාදනයේ විස්තරය සහ අරමුණු**

විස්තරය

මුෂාරක් යනු ෂරියා නීතියට අනුකුල ව්‍යාපෘතියක් මූල්‍යකරණය හා කලමනාකරණය සඳහා දායක වන පාර්ශවයන් මහවුල් පදනිමන් ලාභ අලාභ බෙදාගැනීමට ඇති කරගත් ගිවිසුමකි. මෙය ඒකාබද්ධව වත්කමක හෝ දේපලක හිමිකාරිත්වය සම්පූර්ණයෙන්ම මිලදී ගැනීමේ හවුල් හිමිකරුට පැවරෙන තෙක් හවුල් හිමිකරුවන් අතර අයිතිය බෙදා ගන්නා හවුල් ගිවිසුමකි.

අරමුණ : ලියාපදිංචි කල / නොකල වාහන
උපකරණ
කාරක ප්‍රාග්ධන අවශ්‍යතා
නිවාස දේපල මිලට ගැනීම.

ගනුදෙනුකරුට ප්‍රතිලාභ

- ★ නම්‍යශීලී ගෙවීමේ ක්‍රම
- ★ ලියාපදිංචි කල වාහන
- ★ උපකරණ
- ★ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා
- ★ නිවාස දේපල මිලට ගැනීම්

ඉලක්ක වෙළඳපල

- ★ සංස්ථා
- ★ ව්‍යාපාරිකයින්
- ★ පුද්ගලයින්

ප්‍රධාන නියම සහ කොන්දේසි

අ) මුෂාරක් අයදුම්පත - මෙය සේවාදායකයා විසින් පුරවා ඔහු / ඇය අත්සන් කල යුතුය. මෙය IFSU සේවකයින් විසින් සම්පූර්ණ නොකල යුතුය.

ආ) ගණුදෙනුකරුගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්

නිවාස හෝ දේපල සඳහා ලේඛන

අ) ආරක්ෂාව ලෙස ඉදිරිපත් කරන දේපල සඳහා අවම වශයෙන් අවුරුදු 25 ක හිමිකම් පරීක්ෂාව සඳහා හිමිකම් ඔප්පු

ආ) දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ටාර් වෙතින් ලබාගත් අවම වශයෙන් වසර 25 ක හිමිකම් ඔප්පු සමග පත්ඉරු

ඇ) පලාත් පාලන ආයතනයෙන් ලබාගත් පහත ලේඛන

- ★ නොපැමිණීමේ සහතිකය
- ★ වීදි රේඛා සහතිකය
- ★ හිමිකාරිත්ව සහතිකය
- ★ දේපල ණය ලැබීම් සහ ගෙවීම්

ඈ) මිලදී ගැනීමක් සඳහා වත්කම් හිමිකරුගෙන් එකග වූ මිල අත්තිකාරම් ගෙවීම හා කොන්දේසි ඇතිනම් ඒ පිළිබඳ තොරතුරු

ඉ) ඉදි කිරීමක් සඳහා ප්‍රමාණ පණත් කෙටුම්පත / අනුමත ගොඩනැගිලි සැලැස්ම.

අය කිරීම්

- ★ ලේඛන ගාස්තු
- ★ මුද්දර බදු 0.1%
- ★ මෝටර් රථ ලියාපදිංචි ගාස්තු (අදාල නම් පමණි)
- ★ රක්ෂණ ගාස්තු, ණය කාර්යාංශ, තැපැල් , ව්‍යාපාර පරීක්ෂණ ගාස්තු
- ★ පහසුකම්වල වටිනාකම මත පදනම්ව සේවා ගාස්තු
- ★ පරීක්ෂා කිරීමේ ගාස්තු
- ★ උකස් බැඳුම්කර
- ★ ලියාපදිංචි ගාස්තු
- ★ පුණ්‍ය කටයුතු සඳහා 18% ක සහ පෙරනිමි ගාස්තු ලෙස වාර්ෂික 12% ක ගාස්තුව

**ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සඳහා අවසන් පිටුව පරිශීලනය කරන්න**

## පැමිණිලි ඉදිරිපත්කිරීමේ ක්‍රියාවලිය

පාරිභෝගිකයන්ට තම පැමිණිලි ඉදිරිපත්කිරීමට පහත සඳහන් ක්‍රම සලසා ඇත.

- කළමනාකරු මාර්ගයෙන්
- ඇමතුම් මධ්‍යස්ථානය (Call Center) මගින් (011 2206300)
- විද්‍යුත් තැපැල මගින් (cghu@plc.lk)
- අප වෙත ලිපියක් යොමුකිරීමෙන්: පාරිභෝගික දුක් ගැනවිලි හැසිරවීමේ අංශය (CGHU), **පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී , අංක. 1161, මරදාන පාර, කොළඹ 08.**

අප මූල්‍ය සමාගම විසින් සෑහීමකට පත්වන විසඳුමක් නොසැපයූ අවස්ථාවක පාරිභෝගිකයන්ට තම පැමිණිල්ල ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්වරයාගේ කාර්යාලය වෙත යොමු කළ හැක.


මූල්‍ය ඔම්බුඩ්ස්මන්තුමා,

මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය,

අංක. 143 A, වජිර පාර, කොළඹ 05.

දුරකතන අංකය: +94 11 259 5624

ෆැක්ස් අංකය: +94 11 259 5625

Email: fosril@sltnet.lk

Web: financialombudsman.lk